*සැ. යු.* - 2014.09.19 වැනි දින පළ වූ අංක 1881 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,882 - 2014 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා - 2014.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 844 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 844 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 856 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ඔක්තෝබර් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ඔක්තෝබර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

843 – B 080877—300 (2014/09)
A 1-

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 443

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ I ශ්‍රේණියේ, අනුලා හරස්ගම මහත්මිය 2014 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්,

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

09-1009/1

---

2014 අංක 444

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I පන්තියේ, එම්. ආර්. ජෙයචන්ද්‍රන් මහතා 2014 ජුනි මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්,

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

09-1009/2

---

2014 අංක 445

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. එම්. පී. උදයකාන්ත මහතා 2014 මැයි මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සර්වේයර් ජනරාල් වශයෙන්,

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

09-1009/3

---

2014 අංක 446

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. කුරුප්පු මහතා 2014 මැයි මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලේකම් වශයෙන්,

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

09-1009/4

---

2014 අංක 447

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ගාමිණී ඉලංගරත්න මහතා 2013 නොවැම්බර් මස 11 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි නැවත නියමයක් කරනතුරු ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් සහ නිරවුල් කිරීමේ නිලධාරි වශයෙන්,

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

09-1009/5

---

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/40/2013/ පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.09.26 වැනි දින සිට 2014.10.10 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.10.17 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී දරන කොට්ඨාසයේ 420 වෙළුමේ 257 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ, හේවාගම කෝරළයේ, කොට්ටාව උතුර පිහිටි 'අළුබෝගහවත්ත හෙවත් දෙල්ගහ වත්ත' නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 03 දරන කැබැල්ලට ඩී. ඩබ්. අබේසිංහ බලයලත් මානකතැන විසින් 1979.05.03 දින මැන සාදන ලද අංක 554 පිඹුර ප්‍රකාර මායිම්,<br>*උතුරට* : කැබලි අංක 01 ;<br>*නැගෙනහිරට* : කැබලි අංක 4 ;<br>*දකුණට* : කැබලි අංක 09 දරන ; පාරකට වෙන්කළ කොටස ;<br>*බස්නාහිරට* : කැබලි අංක 02<br>ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 20 | 01. ටී. බී. වනිගසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1980.09.28 දින ලියා සහතික කරන ලද අංක 497 දරන විකුණුම් ඔප්පුව ;<br>02. යූ. ඩබ්. ජයසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.05.05 දින ලියා සහතික කරන ලද අංක 7006 දරන විකුණුම් ඔප්පුව ;<br>03. යූ. ඩබ්. ජයසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.05.05 දින ලියා සහතික කරන ලද අංක 7007 දරන උකස් ඔප්පුව. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී දරන කොට්ඨාසයේ 420 වෙළුමේ 258 පත්ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළයේ, කොට්ටාව උතුර පිහිටි 'අළුබෝගහවත්ත හෙවත් දෙල්ගහ වත්ත' නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 04 දරන කැබැල්ලට ඩී. ඩබ්. අබේසිංහ බලයලත් මානකතැන විසින් 1979.05.03 දින මැන සාදන ලද අංක 554 පිඹුර ප්‍රකාර මායිම්,<br>*උතුරට* : කැබලි අංක 01 ;<br>*නැගෙනහිරට* : කැබලි අංක 05 ;<br>*දකුණට* : කැබලි අංක 09 දරන ; පාරකට වෙන්කළ කොටස ;<br>*බස්නාහිරට* : කැබලි අංක 03.<br>ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 20 | 01. ටී. බී. වනිගසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1980.09.28 දින ලියා සහතික කරන ලද අංක 497 දරන විකුණුම් ඔප්පුව ;<br>02. යූ. ඩබ්. ජයසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.05.05 දින ලියා සහතික කරන ලද අංක 7006 දරන විකුණුම් ඔප්පුව ;<br>03. යූ. ඩබ්. ජයසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.05.05 දින ලියා සහතික කරන ලද අංක 7007 දරන උකස් ඔප්පුව. |

09 - 1088

**ඉඩම් මැනුම් සභාව**

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

2002 අංක 17 දරන මැනුම් පනතේ 43 වන වගන්තිය යටතේ වාර්ෂික බලපත්‍ර අත්හිටුවන ලද ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ නාම ලේඛනය

| *ලියාපදිංචි අංකය* | *සම්පූර්ණ නම* | *වාර්ෂික බලපත්‍රය නිකුත් කිරීම අත්හිටුවන ලද කාලය* |
|---|---|---|
| I. 19710708 | හික්කඩුව විතානගේ අමරපාල ද සිල්වා | 2014.08.14 සිට 2015.08.13 දක්වා |

පී. එම්. පී. උදයකාන්ත,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

2014 ක් වූ සැප්තැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

09-857

---

**වන්දනා ගමන් ආඥා පනත**

ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාල වාර්ෂික පෙරහැර මංගල්‍යය - 2014

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොන්නව ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ පෙරහැර මංගල්‍යය 2014 සැප්තැම්බර් මස 27 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ පළ කෙරෙන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඒ. එම්. පී. අරම්පත්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බමුණාකොටුව.

(2014 සැප්තැම්බර් මස 04වැනි දින,
බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

09-888

එල්. ඩී. බී. 277/40.

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වන වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ජගත් මානෙල් බාලසූරිය වන මා විසින්, 2007 ජූලි මස 06 වැනි දින, අංක 1505 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත කී ආඥා පනතේ 18 වන වගන්තිය යටතේ සාදන ලද නියමයෙහි "ආරක්ෂිත ස්මාරක" යනුවෙන් ප්‍රකාශයට පත් කරන ලද ස්මාරක ලැයිස්තුවෙන්, 42 වන අයිතමය ඉවත් කරනු ලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය ජගත් බාලසූරිය,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

09-1111

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/09/2014/ පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.09.26 වැනි දින සිට 2014.10.10 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.10.17 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර | ඉඩම්වල විස්තර | ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර |
|---|---|---|
| මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී දරන කොට්ඨාසයේ 185 වෙළුමේ 260 පත්‍රිරුව | මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර, කඳුපළාත වල්ගම්පායේ පිහිටි 'වල්අරඹ සහ උඩපිටියේ හේන දැනට තේවත්ත නැමති ඉඩමේ බස්නාහිර පැත්තේ කොටසට මායිම්,<br>උතුරට ඃ සියඹලාකොටුවේ ගලෙන් පල්ල ;<br>නැගෙනහිරට ඃ මහඉඹුල්ගස් සහ එඬරු වැට ;<br>දකුණට ඃ ගනේගෙදර වත්තේ වැට දැනට කරත්ත පාර ;<br>බටහිරට ඃ බෝගහලන්දේ වත්තේ අගල.<br>ප්‍රමාණය : වී දෙපැලයි ලාස් දෙකහමාරයි | 01. සරත් වීරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1969.03.27 වැනි දින ලියා සහතික කරන ලද අංක 6646 දරන විකුණුම් ඔප්පුව |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09 - 1085

---

## වන්දනා පනත

2014 වර්ෂයේ පාණ්ඩිරිප්පු ශ්‍රී තුරෝපති අම්මන් කෝවිල් උත්සවය - අම්පාර දිස්ත්‍රික්කය කල්මුනේ දෙමළ කොටස ප්‍රාදේශීය ලේකම් කාර්යාල වසම

මෙම දේවාලයේ 2014 වර්ෂයේ වාර්ෂික මහෝත්සවය 2014 සැප්තැම්බර් මස 23 වැනි දින ආරම්භව 2014 ඔක්තෝබර් මස 11 වැනි දින නිමාව දැක්වෙන බව සියළුම වන්දනාකරුවන්ට හා අනෙකුත් බැතිමතුන්ට දන්වනු කැමැත්තෙමි.

1951 මැයි මස 11 වැනි දින අංක 10247 දරන රජයේ ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි මෙම උත්සව සමයේ පිළිපදින ලෙස සියළුම වන්දනා කරුවන්ට හා අනෙකුත් බැතිමතුන්ට දන්වනු ලැබේ.

උත්සව භූමියේ සීතියම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| උතුරට | - පාණ්ඩිරිප්පු පිල්ලෙයාර් කෝවිල පාර |
| නැගෙනහිරට | - පාණ්ඩිරිප්පු වෙරළ පාර |
| දකුණට | - කල්මුනේ පාණ්ඩිරිප්පු මායිම පාර |
| බස්නාහිරට | - පෙරියකුලක්කට්ටු පාණ්ඩිරිප්පු |

ප්‍රාදේශීය ලේකම්
කල්මුනේ (දෙ.කො.)

2014 සැප්තැම්බර් මස 02 වැනි දින,

09-856

## වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 03 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

නියෝග

1. මේ නියෝග "රාජගිරිය, සිරි විජයාරාමය විහාරස්ථානයේ මිහිඳු මහා පෙරහැර නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල-

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී සිටින යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නට කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද අදහස් වේ.

තවද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. "කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ සිරි විජයාරාමය විහාරස්ථානයේ" මිහිඳු මහා පෙරහැර සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනා ගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතු ය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුර පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.

එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කාගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුරු පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය :

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;

(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;

(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;

(ඈ) අසනීප වන වන්දනා කරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;

(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;

(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;

(උ) වෙනත් පුණ්‍ය කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;

(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;

(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා, සහ එවැනි පහසුකම් සලසන වෙනත් සථාන ;

(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකණු ලැබුව හොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහා දැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකි ය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබූ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක් ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර, කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතු ය.

8. රෝග වළක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කළහොත්, එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසි වලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අලුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාර දෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා

දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වනු ලැබීම ද එම ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිළියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළමුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක, ජලාශයක, ඇළක දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතු ය.

12. කැළිකසළ දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය කැළිකසළ දැමීම නොකරනු ලැබිය යුතු ය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතු ය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලි හලක්, හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයාගේ හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතු ය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය, කසළ හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා හෝ මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලැබේ.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2කට (ඝන අඩි 4 1/2ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසළ බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය, ලෝහමය, ප්ලාස්ටික්, පියනකින් වසා තැබිය යුතු ය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙම නියෝග වල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුලු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේ දී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේ ය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් හෝ ස්පර්ෂක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්ම ද, එසේ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැනැත්තෙක්ම ද, ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ෂක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගී වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දන්සැලේ නවාතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරී විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්,

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම ; සහ,

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

(30) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්,

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සහ

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් කවර හෝ වේලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

## උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 514 වැලිකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත්, රාජගිරිය, සිරි විජයාරාමය විහාරස්ථානයේ පිහිටි භූමි භාගය.

ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ :

| | |
|---|---|
| *උතුරට* | : රිච් ස්ටයිල් පුද්ගලික සමාගම ; |
| *දකුණට* | : හේමන්ත ජයසිංහ නිවස ; |
| *නැගෙනහිරට* | : රණතුංග නිවස ; |
| *බස්නාහිරට* | : ධර්මපාල පෙදෙස පාර. |

09 - 1044

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/24/2014/ පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.09.26 වැනි දින සිට 2014.10.10 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.10.17 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ දරන කොට්ඨාසයේ 86 වෙළුමේ 102 පත්‍රිරුව | ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, පරගස්තැන්නේ පිහිටි වරිපනම් අංක 244 දරන "කුකුළාරාව" නමැති ඉඩමෙන් බෙදා වෙන්කල අංක 16 දරන කැබැල්ලට එම්.එෆ්.එෆ්. ඉස්මයිල් බලයලත් මානක තැන විසින් 2002.05.03 දින මැන සාදන ලද අංක 305 පිඹුර ප්‍රකාර මායිම්, *උතුරට* : 20 අඩිපාර (එෆ්. එෆ්. ඉස්මයිල්ගේ අංක 21 ප්ලෑනේ ලොට් 6) ; *නැගෙනහිරට* : 20 අඩි පාර, අංක 21 ප්ලෑනේ ලොට් 6 ; *දකුණට* : ලොට් 07 ; *බටහිරට* : ලොට් 03; ප්‍රමාණය : අ. 00, රූ. 00, ප. 32 | 01. වී. කේ. සිවසුබ්‍රමනියම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2002.07.07 දින ලියා සහතික කරන ලද අංක 3002 දරන විකුණුම්කරය. 02. එස්. සත්‍යමූර්ති ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2008.11.08 දින ලියා සහතික කරන ලද අංක 188 දරන විකුණුම්කරය |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09 - 1086

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/21/2014/ පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.09.26 වැනි දින සිට 2014.10.10 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.10.17 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ 534 වෙළුමේ 12 පත්ඉරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කොරළයේ මාම්පේ පිහිටි 'ගොන්නගහවත්ත' නැමති ඉඩමට මායිම්<br>*උතුරට* : කොහුවලවත්ත ;<br>*නැගෙනහිරට* : මෙම ඉඩමේ ලොට් බී ;<br>*දකුණට* : කේ. රන්සොහාමි පීරිස්ට අයිති ලොට් සී හා පාරට වෙන්කළ කොටස ;<br>*බස්නාහිරට* : ඩී. කේ. ඇලිස් ප්‍රේමාවතීට අයිති ගොන්නගහවත්තේ ලොට් ඒ දරන කැබැල්ලේ ඉතිරි දෙකෙන් පංගුව<br>ප්‍රමාණය : අ. 00, රූ. 02, ප. 00 | 01. සිරිලාල් පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1951.10.21 දින ලියා සහතික කරන ලද අංක 157 දරන විකුණුම් කරය.<br>02. එම්. එම්. ඒ. සී. රාස්මාරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1998.08.26 දින ලියා සහතික කරන ලද අංක 1189 දරන තෑගි ඔප්පුව |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

09 - 1087

---

**වන්දනා ගමන් ආඥාපනත**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 03 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

නියෝග

1. මේ නියෝග "වවුනියාව මඩුකන්ද ඓතිහාසික ශ්‍රී දළදා රජ මහා විහාරස්ථ ශ්‍රී දළදා මහා වාර්ෂික පෙරහැර නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල-

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී සිටින යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද අදහස් වේ.

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. "වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කයේ මඩුකන්ද ඓතිහාසික ශ්‍රී දළදා රජ මහා විහාරස්ථානයේ" ශ්‍රී දළදා මහා වාර්ෂික පෙරහැර සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක්

ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනා ගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝගයේ (I) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතු ය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුර පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.

එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කාගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුර පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය :

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;
(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;
(ඈ) අසනීප වන වන්දනා කරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;
(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;
(උ) වෙනත් පුණ්‍ය කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;
(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;
(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා, සහ එවැනි පහසුකම් සලසන වෙනත් සථාන ;
(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහාදැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකි ය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබූ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර, කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතු ය.

8. රෝග වළක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට අලුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාර දෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වනු ලැබීම ද, එම ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළමුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක, ජලාශයක, ඇළක දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතු ය.

12. කැළිකසළ දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැළිකසළ දැමීම නොකරනු ලැබිය යුතු ය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතු ය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලි හලක්, හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, හෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ හෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයාගේ හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, හෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතු ය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතිරි වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය, කසළ හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක්, හෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා හෝ මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලැබේ.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, හෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2කට (ඝන අඩි 4 1/2ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය, ලෝහමය, ප්ලාස්ටික්, පියනකින් වසා තැබිය යුතු ය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙය නියෝග වල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, හෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ හෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් භාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේ දී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේ ය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (I) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්ම ද එසේ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැනැත්තෙක්ම ද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගී වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ භෝජනාගාරයේ, දන්සැලේ නවාතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරි විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්,

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම ; සහ,

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

(30) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්,

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සහ,

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් කවර හෝ වේලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

### උපලේඛනය

වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මඩුකන්ද ග්‍රාම නිලධාරී වසමට අයත්, වවුනියාව මඩුකන්ද ඓතිහාසික ශ්‍රී දළදා රජ මහා විහාරස්ථානයේ පිහිටි භූමි භාගය.

ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ :

| | |
|---|---|
| *උතුරට* | : කුස්සිවෙල වෙල් යාය හා නෙඩුන්කුලම ග්‍රාමය ; |
| *දකුණට* | : හොරොව්පොතාන වවුනියාව ප්‍රධාන මාර්ගය ; |
| *නැගෙනහිරට* | : පිරමනාන්කුලම වෙල් යාය ; |
| *බස්නාහිරට* | : පිංවෙල වෙල් යාය. |

09 - 1045

---

### වන්දනා ගමන් ආඥා පනත

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ රොටුඹ පෙත් මග පුරාණ රජමහා විහාරයේ 2014 වාර්ෂික ඇසළ උත්සවය 2014 සැප්තැම්බර් මස 29 වැනි සඳුදා දින සිට 2014 ඔක්තෝබර් මස 05 වැනි ඉරිදා දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥා පනතේ 02 වගන්තිය අනුව 2009.09.18 වැනි දින නිකුත් කරන ලද අංක 1620 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය යටතේ මෙයින් දන්වමි.

කේ. එන්. කෞශල්‍යා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
පස්ගොඩ.

2014 සැප්තැම්බර් මස 02 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-1010

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු යූනියන් බැංකුව වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.07.04 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මන්නාරම කෙලින් වීදියේ ප්‍රධාන කාර්යාලය පිහිටි රහීම් ඇන්ඩ් සන්ස් යන නාමයෙන් වූ ව්‍යාපාරයේ හවුල්කරුවන් වන මීරාසාහිබ් අබ්දුල් රහීම් නොහොත් මීරා සාහිබු අබ්දුල් රහීම්, අබ්දුල් රහීම් අජමාල්ඛාන්, අබ්දුල් රහීම් අම්ජඩීන් සහ අබ්දුල් රහීම් මොහොමඩ් අසර් (මෙහි මින් මතු බන්ධනදායීන් වශයෙන් හඳුන්වනු ලබන) සහ උප්පුකුලම්, කෂ්මීර් වීදියේ අංක 754 දරන ස්ථානයේ පදිංචි මීරාසාහිබ් අබ්දුල් රහීම් නොහොත් මීරා සාහිබු අබ්දුල් රහීම්, (මෙහි මින් මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) යන අය විසින් මූල්‍ය පහසුකම් ලබා ගෙන ඇති බැවින් ද, එකී මූල්‍ය පහසුකම් නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් පනස්ලක්ෂයක (රු. 50,00,000) මුදල ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී බන්ධනදායීන් සහ උකස්කරු විසින් මන්නාරම ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. සබූර්දීන් විසින් රුපියල් පනස්ලක්ෂයක (රු. 50,00,000) මුදල සඳහා සහතික කරන ලද අංක 10389 සහ 2011.06.29 වැනි දින උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව සඳහන් දේපළ යූනියන් බැංකුව වෙත උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඒ අනුව, ඉහත කී මූල්‍ය පහසුකම් නිසා 2013.09.26 වන දිනට මුලු හිඟ මුදල වන රුපියල් හතළිස්ලක්ෂ අසූදහස් හාරසිය හැත්තෑහයකුත් ශත හතළිස්තුනක (රු. 4,080,476.43) මුදල සහ 2013.09.27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත පොළිය ද එකී බන්ධනදායීන්ගෙන් සහ උකස්කරුවන්ගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී බන්ධනදායීන් විසින් ඉහත කී ණය ශේෂය හෝ ඉන් කොටසක් ගෙවා පියවා දැමීම පැහැර හැරීම කර ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසුව, යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින් ඉහත කී මූල්‍ය පහසුකම් නිසා 2013.09.26 නැකි දිනට මුලු හිඟ මුදල වන රුපියල් හතළිස්ලක්ෂ අසූදහස් හාරසිය හැත්තෑහයකුත් ශත හතළිස්තුනක (රු. 4,080,476.43) මුදල සහ 2013.09.27 වැනි දින සිට ඒ මත පොළිය ද, තව ද, අංක 10389 දරන උකස් බැඳුම්කර සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවට හිමිකම් ඇති වෙනත් සියලු ම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා අංක 10389 සහ 2011.06.29 දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ 1990 අංක 04 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම කොට්ඨාසයේ නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නැමති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වන නැගෙනහිරට, වර්තමානයේ මීරසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහාමඩ් යාසින් නූරුල් කාරිමාට අයිති දේපළ ද, උතුරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් යාසින්ට අයිති දේපළ ද, බස්නාහිරට : අබ්දුල් රහීම් මොහොමඩ් සකෙරියාගේ දේපළද, දකුණට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දු රහීම්ට අයිති කලින් මොහොමඩ් යාසින් නූරුල් කරිමාට අයිති දේපළ ද, යන මෙකී මායිම් තුළ පිහිටි නැගෙනහිර සිට බස්නාහිරට අඩි දහහතක් (17) සහ උතුරේ සිට දකුණට අඩි දොළහක් (12)ක් විශාල බෙදා වෙන් කළ බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B70/232 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නැමති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වන නැගෙනහිරට : වර්තමානයේ මීරාසහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් යාසින් නූරුල් කරිමාට සහ අබ්දුල් හකීම් මොහොමඩ් ඉල්ලියාස්ගේ බිරිඳ වන නූරුල් කුඩුසියාට අයිති දේපළ ද, උතුරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් යාසින් නූරුල් කරිමාට අයිති දේපළ ද, බස්නාහිරට : අබ්දුල් රහීම් මොහොමඩ් සකෙරියාගේ දේපළ ද, දකුණට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් යාසින්ගේ දේපළ ද, යන මෙකී මායිම් තුළ පිහිටි නැගෙනහිර සිට බස්නාහිරට අඩි දහහතක් (17) සහ උතුරේ සිට දකුණට අඩි දොළහක් (12) ක් විශාල බෙදා වෙන් කළ බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B70/233 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නමැති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වන නැගෙනහිරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මෙහොමඩ් යාසින් නූරුල් කාරිමාට සහ අබ්දුල් හකීම් මොහොමඩ් ඉල්ලියාස්ගේ බිරිඳ වන නූරුල් කුඩුසියාට අයිති දේපළ ද, උතුරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් යාසින්ගේ දේපළ ද, බස්නාහිරට : අබ්දුල් රහීම් මොහොමඩ් සකෙරියාගේ දේපළ ද, දකුණට : පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ද, යන මෙකී මායිම් තුළ පිහිටි නැගෙනහිර සිට බස්නාහිරට අඩි දහහතක් (17) සහ උතුරේ සිට දකුණට අඩි පහළොවක් (15) ක් විශාල බෙදා වෙන් කළ බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B70/234 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

4. ඉහත කී නැගෙනහිර මන්නාරම නරගයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නමැති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වන නැගෙනහිරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් අබ්දුල් රහුමාන් මොහොමඩ් සකෙරියාගේ බිරිඳ වන පාතුම්මා නූරියාට සහ අබ්දුල් හකීම් මොහොමඩ් ඉල්ලියාස්ගේ බිරිඳ වන නූරුල් කුඩුසියාට අයති දේපළ ද, උතුරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් යාසින් නූරුල් කරිමාට අයිති දේපළ ද, බස්නාහිරට : අබ්දුල් රහීම් මොහොමඩ් සකෙරියගේ දේපළ ද, දකුණට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් යාසින් නූරුල් කාරිමාට සහ අබ්දුල් හකීම් මොහොමඩ් ඉල්ලියාස්ගේ බිරිඳ වන නූරුල් කුඩුසියාට අයිති දේපළ ද, යන මෙකී මායිම් තුළ පිහිටි නැගෙනහිර සිට බස්නාහිරට අඩි දහහතක් (17) සහ උතුරේ සිට දකුණට අඩි දොළහක් (12) ක් විශාල බෙදා වෙන්කළ බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B70/236 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී 3 වන සහ 4 වන ඉඩම් වර්තමානයේ දී ඒකාබද්ධ කොට එකම ඉඩමක් වශයෙන් පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම කොට්ඨාසයේ නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නමැති ඉඩමට (ඉහත කී ඉඩම් දෙක වර්තමානයේ ඒකාබද්ධ කොට එකම ඉඩම් කැබැල්ලක් වන) පුත්තලම බලයලත් මිනින්දෝරු වී. බාලසුබ්‍රමනියම් විසින් මැන සාදන ලද අංක 195 සහ 2005.05.22 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන බිම් කොටසට මායිම් උතුරට : ආරුමුගම් අරසකොනේගේ දේපළ ද, නැගෙනහිරට : කෙලින් වීදිය ද, දකුණට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් අබ්දුල් රහීම් අජමල්කානේගේ දේපළ ද, බස්නාහිරට : ග්‍රාමීය සංවර්ධන පදනමේ දේපළ ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම හතරයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 5.42) විශාල බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B123/234 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

5. ඉහත කී නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නමැති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වන නැගෙනහිරට : කෙලින් වීදිය ද, උතුරට : සන්තියෝගුගේ වැන්දඹුව වන සිසිලියාගේ දේපළ ද, බස්නාහිරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් යාසින්ගේ දේපළ ද, දකුණට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් යාසීන් නුරුල් කරීමාට අයිති දේපළ ද, යන මෙකී මායිම් තුළ පිහිටි නැගෙනහිර සිට බස්නාහිරට අඩි තිස්හයක් (36) සහ උතුරේ සිට දකුණට අඩි එකොළහයි අඟල් නවයක් (11'-9") විශාල බෙදා වෙන් කළ බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B69/222 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

6. ඉහත කී නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නමැති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වන නැගෙනහිරට : කෙලින් වීදිය ද, උතුරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් යාසින් නුරුල් කරීමාට අයිති දේපළ ද, බස්නාහිරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් යාසින්ගේ දේපළ ද, දකුණට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් යාසින්ට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටසද, යන මෙකී මායිම් තුළ පිහිටි නැගෙනහිර සිට බස්නාහිරට අඩි තිස්හයක් (36) සහ උතුරේ සිට දකුණට අඩි එකොළහයි අඟල් නවයක් (11'-9") විශාල බෙදා වෙන් කල බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B69/233 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී 5 වන සහ 6 වන ඉඩම් වර්තමානයේ දී ඒකාබද්ධ කොට එකම ඉඩමක් වශයෙන් පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම කොට්ඨාසයේ නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නමැති ඉඩමට (ඉහත කී ඉඩම් දෙක වර්තමානයේ ඒකාබද්ධ කොට එකම ඉඩම් කැබැල්ලක් වන) පුත්තලම බලයලත් මිනින්දෝරු වී. ටී. බාලසුබ්‍රමනියම් විසින් මැන සාදන ලද අංක 2549 සහ 2004.02.10 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන බිම් කොටසට මායිම් නැගෙනහිරට : කෙලින් වීදිය ද, උතුරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් අබ්දුල් හකීම් මොහොමඩ් ඉල්ලියාස්ගේ බිරිඳ වන නුරුල් කුඩුසියාට අයිති දේපළ ද, බස්නාහිරට සහ දකුණට : කොරිඩෝව ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම දහසයක් (අ. 0, රූ. 0, පර්. 3.16) විශාල බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B114/205 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

7. ඉහත කී නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නමැති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වන නැගෙනහිරට : කෙලින් වීදිය ද, උතුරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් අබ්දුල් හකීම් මොහොමඩ් ඉල්ලියාස්ගේ බිරිඳ වන නුරුල් කුඩුසියාට අයිති දේපළ ද, බස්නාහිරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් යාසින්ගේ දේපළ ද, දකුණට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් යාසින්ට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටසද, යන මෙකී මායිම් තුළ පිහිටි නැගෙනහිර සිට බස්නාහිරට අඩි තිස්හයක් (36) සහ උතුරේ සිට දකුණට අඩි එකොළහයි අඟල් නවයක් (11'-9") විශාල බෙදා වෙන් කළ බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B69/225 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

8. ඉහත කී නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදු වලවු නමැති ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වන නැගෙනහිරට : පාර ද, උතුරට : අබ්දුල් රහීම් මොහොමඩ් සකෙරියාගේ බිරිඳ වන පාතුම්මා නූර්යාගේ ඉඩමේ කොටසක් ද, බස්නාහිරට : වර්තමානයේ මීරාසාහිබ් අබ්දුල් රහීම්ට අයිති කලින් මොහොමඩ් යාසින් නුරුල් කරීමාට සහ අබ්දුල් හකීම් මොහොමඩ් ඉල්ලියාස්ගේ බිරිඳ වන නුරුල් කුඩසියාට අයිති දේපළද, දකුණට : පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිල්ලද, යන මෙකී මායිම් තුළ පිහිටි නැගෙනහිර සිට බස්නාහිරට අඩි හතළිස්හතයි දශම හයක් (47.6) සහ උතුරේ සිට ගිණිකොණට අඩි හතරක් (4) සහ නිරිතට අඩි පහක් (5) විශාල බෙදා වෙන් කළ බිම් කැබැල්ලය. මෙම දේපළ මන්නාරම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B70/235 දරන වෙළුමේ ලියාපදිංචි කර ඇත.

උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම කොට්ඨාසයේ නැගෙනහිර මන්නාරම නගරයේ පිටකොටුවේ පිහිටි ලැන්ගෙන්බර්ග් වීදුවලවු නමැති ඉඩමට (ඉහත කී ඉඩම් අට වර්තමානයේ ඒකාබද්ධ කොට එකම ඉඩම කැබැල්ලක් වන) මන්නාරම උප්පුකුලම් පල්ලිය පාරේ අංක 160 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු වන එම්. සී. එම්. රාෆික් විසින් නැවත මැන සාදන ලද අංක 2035 සහ 2010.11.04 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන බිම් කොටසට මායිම් (උප්පුකුලම් බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු වන වී. ටී. බාලසුබ්‍රමනියම් විසින් මැන සාදන ලද අංක 104/2010 සහ 2010.07.25 දින දරන පිඹුරේ ප්‍රකාර පර්චස් හතයි දශම බින්දුවයි එකක් (අ. 0, රූ. 0, පර්. 7.01) උතුරට : ආරුමුගම් අරසකෝන්ගේ දේපළ ද, නැගෙනහිරට : අංක 2035 දරන පිඹුර පාර සඳහා වෙන් කළ බිම් තීරය වන කැබලි අංක 2 ද, දකුණට : තැපැල් දෙපාර්තමේන්තුව හිමිකම් කියන පරිශ්‍රය ද, බස්නාහිරට : ග්‍රාමීය සංවර්ධන පදනම හිමිකම් කියන පරිශ්‍රය ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම බින්දුවයි එකක් (අ.0, රූ. 0, පර්. 7.01) විශාල බිම් කැබැල්ල සහ වරිපනම් අංක දරන 33, 33/01, 33/02, 33/03, සහ 35/ඒ දරන සාප්පු ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේත් සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩයේ ලේකම්.

09-1134

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2014.04.07 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. විජේසිංහ විසින් සහතික කරන ලද 2012.06.05 දිනැති අංක 162 දරන උකස් බැඳුම්කරයට අනුව 2014.01.31 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් එක්කෝටි අනූ හත් ලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය පනස් එකයි ශත දොළහක (රු. 1,97,72,751.12) මුදල සමග රුපියල් එක්කෝටි හැට දෙලක්ෂ එක්දහස් හත්සිය හැට හයයි ශත හතලිස් හයක (රු. 1,62,01,766.46) මුදල මත වසරකට සියයට දහඅටයි දශම පහක (18.5%) බැගින් පොලියක් 2014.02.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මීගමුව, ශාන්ත ලාසරස් පාරේ, අංක 89 හි පදිංචි මොහොමඩ් අම්ෂාර් අන්සාෆ් යූසුෆ් මහතා සහ අහමඩ් ජමීල්ඩීන් මරික්කාර් මොහොමඩ් අබුයූසෆ් මහතා සහ ෆාතිමා අස්වියා යූසුෆ් විවාහයට පෙර ෆරීඩ් මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. 2012.06.05 දිනැති එකී අංක 162 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි අනූ හත් ලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය පනස් එකයි ශත දොළහක (රු. 1,97,72,751.12) මුදල සමග 2014.02.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකු වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, අංක 182/3 හි පදිංචි වෙන්දේසිකාර ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, දෙහිවල ශාඛාවේ ප්‍රධාන කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මදුරන්කුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තලම ප්‍රාදේශීය සභා සීමාවේ, මදුරන්කුලි ග්‍රාමයේ, කොළඹ පාරේ පිහිටි "මදුරන්කුලි තෝට්ටම් නොහොත් චන්ඩිවේනෙයි" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු වී. විග්නේශ්වරන් විසින් සාදන ලද 2012 ජනවාරි 12 දිනැති අංක 6175 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ලංකා බැංකු මදුරන්කුලිය ශාඛාවේ ඉඩම සහ පරිශ්‍රය ද නැගෙනහිරට : පාර (අඩි 12 පළල) ද, දකුණට එස්. එච්. එම්. උම්මා සහ සිද්දීක්ට අයත් ඉඩම ද, බස්නාහිරට : හලාවත පුත්තලම් පාරද මායිම්ව එකී අංක 6175 දරන පිඹුරුට අනුව පර්චස් තිස් අටයි දශම හයයි පහක (අ. 0, රූ. 0, පර්. 38.65) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P119/77 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. එස්. එම්. පී. ගුණතිලක,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
දෙහිවල.

09-1006

---

### මහජන බැංකුව - කොටිකාවත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී(29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.04.25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මිය විසින් 2012.01.18 දින සහතික කරන ලද උකස් ඔප්පු අංක 3472 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම කුරුප්පු ආරච්චිගේ දොන් නිරංජන් මයා යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී බැඳුම්කරය මත රුපියල් හතලිස් හත් ලක්ෂ හැත්තෑ හත් දහස් එකසිය දෙකයි සහ දොළහක (රු. 47,77,102.12) මුදලක් මහජන බැංකුට අයවීමට ඇති බැවින් ද, 2013.08.18 වැනි දින සිට වර්ෂයකට 16% බැගින් රුපියල් රුපියල් හතලිස් හත් ලක්ෂ හැත්තෑ හත් දහස් එකසිය දෙකයි සහ දොළහක (රු. 47,77,102.12) මුදලකට වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකරගත යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හතලිස් හත් ලක්ෂ හැත්තෑ හත් දහස් එකසිය දෙකයි සහ දොළහක (රු. 47,77,102.12) මුදලක් ද අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා විසින් එකී අංක 3472 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, අධිකාරි පත්තුවේ, මුල්ලේරියාව යන ගම පිහිටි "කැබෙල්ලගහවත්ත හෙවත් බෝගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ආර්. ටී. අබේසිංහ විසින් සාදන ලද අංක 1975 ඒ දරන 2011.09.15 දිනැති පිඹුරේ ලොට් "1" දරන කොටසට මායිම් : උතුරට එස්. ඩබ්. ජේ. පෙරේරා සහ අනෙකුත් අයට අයත් ඉඩම සහ පී. එල්. වනිගසූරියට අයත් ඉඩම ද, නැගෙනහිරට : වර්ණමාල් රණසිංහ සහ අනෙකුත් අයට අයත් ඉඩම ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ 3 ද, බස්නාහිරට : පාලිත ධර්මසිරිට අයත් ඉඩම ද, යන මෙකී මායිම් වූ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ. මෙකී ඉඩම සඳහා පිඹුරු අංක 1975A හි කැබලි අංක 3 හි මාර්ග අයිතිය ද වේ.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කරන ලද්දකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, අධිකාරි පත්තුවේ, මුල්ලේරියාව යන ගම පිහිටි "කැබෙල්ලගහවත්ත හෙවත් බෝගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එන්. ඩී. සිරිසේන විසින් සාදන ලද අංක 29 දරන 1958.08.31 දිනැති පිඹුරේ (එන්. ඩී. කුරේ අවසරලත් මානක තැනගේ 1943.09.22 හා අංක 41/19437 දරන පිඹුරේ ලොට් සී දරන කොටසේ (නැවත මැනීමක් වූ) ලොට් 2 දරන කොටසට මායිම් : උතුරට : එන්. ඩී. කුරේ අවසරලත් මානක තැනගේ පිඹුරු අංක 41/1943 හි ලොට් ඒ ද, නැගෙනහිරට : ඩබ්. ඒ. හෙන්ද්‍රික් පෙරේරාට සහ තවත් අයට අයිතිව තිබූ දේපළ ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 3 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ම ලොට් 1 (පාර) ද. යන මෙකී මායිම් වූ පර්චස් විසි අටක්

(අ. 0, රූ. 0, පර්. 28) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

ඉහත සඳහන් ඉඩම නව මිණුමකට අනුව පහත සඳහන් පරිදි විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, අධිකාරී පත්තුවේ, මුල්ලේරියාව යන ගම පිහිටි "කැබෙල්ලගහවත්ත හෙවත් බෝගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ආර්. ටී. අබේසිංහ විසින් සාදන ලද අංක 1975 දරන 2011.09.15 දිනැති පිඹුරේ ලොට් 2 A දරන කොටසට මායිම් : උතුරට : එස්. ඩබ්. ජේ. පෙරේරා සහ අනෙකුත් අයට අයත් ඉඩම සහ පී. එල්. වනිගසූරියට අයත් ඉඩම ද නැගෙනහිරට : වර්ණමාල් රණසිංහ සහ අනෙකුත් අයට අයත් ඉඩම ද, දකුණට : නිහාල් කරුණාරත්නට අයත් ඉඩම සහ පාර ද, බස්නාහිරට : පාලිත ධර්මසිරිට අයත් ඉඩම ද යන මෙකී මායිම් වූ පර්චස් විසිහතයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 27.75) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

මෙම උකස්කරය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ L1142/44 යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප - 11).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 177ඒ, හයිලෙවල් පාර,
නුගේගොඩ.

09 - 1019

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 769076 සහ 1142742
සිමැක්රෝ කන්ස්ට්‍රක්ෂන්

2014 ජුනි 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එල්. වීරසේකර විසින් 2011 මාර්තු 15 වැනි දින සහතික කරන ලද අංක 15703, දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරය යටතේ (මෙහි පළමු උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) අයවිය යුතු මුදල් ගෙවීම සිමැක්රෝ කන්ස්ට්‍රක්ෂන් යන නීත්‍යානුකූල නාමය යටතේ හවුල් ව්‍යාපාර ආයතනයක් පවත්වාගෙන යනු ලබන ජයසිංහගේ පූර්ණ දර්ශන, බාලගේ නන්දසේන, වෙදගේ චමින්ද දිමුතු ලංකා ප්‍රනාන්දු, දැඩිගමුවගේ අමල් ධනුෂ්ක පීරිස් සහ වැවගේ නිරෝෂන් සංජීව අල්විස් ණයකරුවන් වශයෙන් සහ බාලගේ නන්දසේන උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එන්. පී. හීන්කෙන්ද විසින් 2012 මාර්තු 09 වන දින සහතික කරන ලද අංක 123 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දාවූද බැඳුම්කරය යටතේ (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති) අයවිය යුතු මුදල් ගෙවීම සිමැක්රෝ කන්ස්ට්‍රක්ෂන් යන නීත්‍යානුකූල නාමය යටතේ හවුල් ව්‍යාපාර ආයතනයක් පවත්වාගෙන යනු ලබන බාලගේ නන්දසේන, ජයසිංහගේ පූර්ණ දර්ශන වැවගේ නිරෝෂන් සංජීව අල්විස් වෙදගේ චමින්ද දිමුතු ලංකා ප්‍රනාන්දු සහ දැඩිගමුවගේ අමල් ධනුෂ්ක පීරිස් ණයකරුවන් වශයෙන් සහ ජයසිංහගේ පූර්ණ දර්ශණ උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද

එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි විසිනමලක්ෂ අසූපන්දහස් අටසිය හැටහතරයි ශත හතළිස් අට (රු. 12,985,864.48)ක මුදලක් 2013 අගෝස්තු මස 19 වන දින වන විට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රුපියල් එක්කෝටි විසිනමලක්ෂ අසූපන්දහස් අටසිය හැටහතරයි ශත හතළිස් අට (රු. 12,985,864.48)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 අගෝස්තු 20 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 11,122,664ක මුදල මත 15% වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 15703 සහ 123 දරන බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තාවූද මෙහි පළවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ඩ්‍රොප් වීදියේ අංක 182හි 3 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්ද ප්‍රාදේශීය සභා සීමාවේ වලාන පිහිටි ගැඩඹුගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දොරු වයි. කරුණාරත්න විසින් 1994 ඔක්තෝබර් 25 දින සාදන ලද අංක 1815 දරන පිඹුරේ ලොට් D වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : බලයලත් මිනින්දෝරු බී. එම්. එෆ්. කල්දේරා විසින් 1924 නොවැම්බර් 08 දින සාදන ලද අංක 9514 දරන පිඹුරේ ලොට් B සහ C ද, නැගෙනහිරට : කලින් කට්ටස් ඕවිට වශයෙන් හැඳින්වුන දැනට වලාන කට්ටස්ස පාර ද, දකුණට : ඉහත සඳහන් අංක 9514 දරන පිඹුරේ ලොට් E ද සහ බස්නාහිරට : කහටගහවත්ත සහ ගල්පොත්තවත්තෙන්ද මායිම් වූ එකී අංක 1815 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්එකයි දශම හයයි හතක (අ. 0, රූ, 0, පර්. 31.67) විශාලත්වයෙන් වූ ඉඩම, ගහකොළ, වැවිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F 574/224 යටතේ ලියාපදංචි වී ඇත.

### දෙවන උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ නගර සභා සීමාවේ පානදුර නගරයේ පට්ටිය පිහිටි මාඇලබොඩවත්ත සහ අට්ටික්කගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දොරු එස්. රාජපක්ෂ විසින් 2007 සැප්තැම්බර් 16 වැනි දින සාදන ලද අංක 496A/2007 දරන පිඹුරේ ලොට් 6 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ජයතිලක මාවත ද, නැගෙනහිරට : මෙහි ලොට් 7න් ද, දකුණට : මෙහි ලොට් 9න් ද සහ බස්නාහිරට : ලොට් 5න්ද මායිම් වූ එකී අංක 496A/2007

දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයක (අ. 0, රූ, 0, පර්. 6) විශාලත්වයෙන් වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F 542/256 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ නගර සභා සීමාවේ පානදුර නගරයේ පට්ටිය පිහිටි මාඇලබොඩවත්ත සහ අට්ටික්කගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් 2007 සැප්තැම්බර් 16 වැනි දින සාදන ලද අංක 496A/2007 දරන පිඹුරේ ලොට් 8 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ජයතිලක මාවත ද, නැගෙනහිරට : කාණුව ද, දකුණට : මෙහි ලොට් 9න් ද සහ බස්නාහිරට : ලොට් 7න්ද මායිම් වූ එකී අංක 496A/2007 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයක (අ. 0, රූ, 0, පර්. 6) විශාලත්වයෙන් වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F 542/257 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් මාර්ග වෙන්කිරීම මතුපිටින් සහ ඒ දිගේ එහා මෙහා යෑමේ අයිතිය සමග වේ.

බලය ලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් 2007 සැප්තැම්බර් 16 වැනි දින සාදන ලද අංක 496A/2007 දරන පිඹුරේ ලොට් 7 (පාරක් සඳහා වෙන්කිරීමක්) වශයෙන් දැක්වෙන ඉඩම් කට්ටිය වේ.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

09 - 1015

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හෙට්ටිවීදිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

කදිරේසන් ලැවේන්ඩ්‍රන් සහ ගාජේන්තිනි ලැවේන්ඩ්‍රන්.

2014 අගෝස්තු මස 28 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2012 ජනවාරි 27 වන දින සහතික කළ අංක 1473 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කදිරේසන් ලැවේන්ඩ්‍රන් සහ ගජේන්තිනි ලැවේන්ඩ්‍රන් ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූතුන්ලක්ෂ හතලිස්අටදහස් එකසියහතලිහයි ශත හැටනමය (රු. 83,48,140.69) ක මුදලක් 2014 ජුනි 25 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 8,348,140.69 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ජුනි 26 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1473 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදාන කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ (නමුත් කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරලේ අධිකාරී පත්තුවේ වත්තල - මාබෝලේ නගර සභා සීමාව තුල වසම් අංක 4 හි තෙලඟපාත ගමේ පිහිටි තෙලඟපාත මාවතේ වරිපනම් අංක 103/13ඩී දරන ගොරකගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඩොනල්ඩ් විසින් 1989 ජනවාරි 28 වන දින සාදන ලද අංක 364 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලෙස 2A දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : දැන් බී. ආරියදාසට අයිති එම ඉඩමේම ඉතිරි කොටසකින් ද, නැගෙනහිරට : දැන් සියරට මුදලාලිට අයිති ගොරකගහකුඹුර නොහොත් පිටවෙලෙන් ද දකුණට: දැන් ටී. එච්. ඉනෝහාමිට අයිති ඉඩමේ වරිපනම් අංක 103/4 දරන ලොට් 2බී වලින් ද සහ බස්නාහිරට : ලොට් 2 සී (අඩි 10 ක් පළල පාරෙන් ද) මායිම් වූ එකී අංක 364 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහ (අ. 0, රූ. 0, පර්. 12) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු බී 983/222 යටතේ ලියාපදිංචි වී ඇත.

පහත සඳහන් කරන ලද පිඹුරු අංක 5009/2005 දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ආර්. යූ. විජේතුංග විසින් 2005 මැයි 25 වන දින මෑතකදී කරන මැනීමකින් එය පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර වේ.

බස්නාහිර පළාතේ (නමුත් කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරලේ අධිකාරී පත්තුවේ වත්තල මාබෝලේ නගර සභා සීමාව තුල වසම් අංක 4 හි තෙලඟපාත ගමේ පිහිටි තෙලඟපාත මාවතේ වරිපනම් අංක 103/13 ඩී දරන ගොරකගහකුඹුර නමැති ඉඩමට මායිම් වශයෙන් උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : දැන් රාජේන්ද්‍රන්ට අයිති වරිපනම් අංක 103/13ඒෆ් වලින්ද දකුණට : දැන් ටී. එච්. ඉනෝහාමිට අයිති වරිපනම් අංක 103/14 න් ද සහ බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ එකී අංක 5009/2005 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහ (අ. 0, රූ. 0, පර්. 12) ක විශාල්තවයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

එකී අංක 1473 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ප්‍රවේශ මාර්ග අයිතීන්ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-1153/1

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නාවලපිටිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ටිකිරි හෙන්නැදිගේ ඉන්ද්‍රපාල රෝහිණී ප්‍රේමවර්ධන සහ ටිකිරි හෙන්නැදිගේ අමිල චතුර ඉන්ද්‍රපාල.

2014 අගෝස්තු මස 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූද 2013 අප්‍රේල් 10 වන දින සහතික කළ අංක 3122 සහ 2013 ජූලි 05 දින සහතික කළ අංක 3210 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ටිකිරි හෙන්නැදිගේ ඉන්ද්‍රපාල රෝහිණී ප්‍රේමවර්ධන සහ ටිකිරි හෙන්නැදිගේ අමිල චතුර ඉන්ද්‍රපාල ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් තුන්කෝටි දසලක්ෂ හතලිස්අටදහස් පන්සිය හැටඅටයි ශත හැට අට (රු.31,048,568.68) ක මුදලක් 2014 ජූලි 16 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 31,048,568.68 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ජූලි 17 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3122 හා 3210 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යටිනුවර ගඟවට කෝරලේ මහනුවර මහනගර සභා සීමාව තුල කටුකැලේ ග්‍රාමසේවා නිළධාරි වසම් අංක 255 තුල සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 948, කලින් කටුකැලේ නොහොත් පේරාදෙණිය පාර දැනට (පැරණි අංකය) හි නව වරිපනම් අංක 252 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු සී. ඒ. ඕ. ඩිරෙක්ස් විසින් පිළියෙල කරන ලද 1979 ජනවාරි 06 වන දින සාදන ලද අංක 467 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ඇති ඉඩමට මායිම් වශයෙන් උතුරට මුඩ්ලියර් ජෝසප් විජේසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට වරිපනම් අංක 250 දරන සිරිමාවෝ බණ්ඩාරනායක මාවත පරිශ්‍රයෙන් ද, දකුණට සිරිමාවෝ බණ්ඩාරනායක මාවතෙන් ද සහ බස්නාහිරට වරිපනම් අංක 254 දරන සිරිමාවෝ බණ්ඩාරනායක මාවත පරිශ්‍රයෙන් ද මායිම් වූ පර්චස් හයයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 6.4) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඒ 412/255 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් ඉඩම මෑතකදී කළ මැනීමකින් පසු මෙසේ විස්තර කෙරේ.

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යටිනුවර ගඟවට කෝරලේ මහනුවර මහනගර සභා සීමාව තුල කටුකැලේ ග්‍රාමසේවා නිළධාරි වසම් අංක 255 තුල, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ හි වරිපනම් අංක 252 දරන පේරාදෙණිය පාර නොහොත් කටුකැලේ හි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. එම්. වී. මාපිටිගම විසින් පිළියෙල කරන ලද 2012 නොවැම්බර් 30 වන දින සාදන ලද අංක 698 දරන පිඹුරෙන් බෙදා වෙන් කල ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට හිල් ටොප් හෝටලයෙන්ද නැගෙනහිරට වරිපනම් අංක 250 දරන පරිශ්‍රයෙන් ද දකුණට සිරිමාවෝ බණ්ඩාරනායක මාවතෙන් ද සහ බස්නාහිරට වරිපනම් අංක 254 දරන පරිශ්‍රයෙන් ද මායිම් වූ පර්චස් හයයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 6.4) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමඟ වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,  
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),  
මාණ්ඩලික ලේකම්.

09-1153/2

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අක්කරෙයිපත්තු ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ශ්‍රීපති රවීන්ද්‍රනාත් - තනි අයිතිකරු අරවින්ද් ට්‍රේඩර්ස්

2014 අගෝස්තු මස 28 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

නින්දවූර් ප්‍රසිද්ධ නොතාරිස් එස්. මුතුමීරන් විසින් සහතික කරන ලද්දාවූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූද 2002 අගෝස්තු මස 19 වන දින සහතික කළ අංක 4645, 2002 නොවැම්බර් 07 දින සහතික කළ අංක 4815, 2008 පෙබරවාරි 27 දින සහතික කළ අංක 6516, 2010 අප්‍රේල් 06 දින සහතික කළ අංක 6865, 2009 ජූනි 04 වන දින සහතික කළ අංක 6720, සහ 2011 අගෝස්තු 09 දින සහතික කළ අංක 7332, දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රීපති රවීන්ද්‍රනාත් තනි අයිතිකරු අරවින්ද් ට්‍රේඩර්ස් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි තිස්අටලක්ෂ අටදහස් අටසිය පනහයි ශත හැත්තෑදෙක (රු.1,38,08,850.72) ක මුදලක් 2014 මැයි 06 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,38,08,850.72 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 මැයි 07 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 4645, 4815, 6516, 6865 සහ 6720 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තුවේ කරුන්කොඩිතිව් කොට්ඨාස අංක 08 හි පිහිටි ලොට් 130 සහ 5566 හි නැගෙනහිර පෙදෙසේ මැද කොටස වන නාවක්කඩු නැමති ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : වී. අලිසප්පුගේ ඉඩමෙන් ද, නැගෙනහිරට:

සගම වීදියෙන් ද දකුණට : කුඩා පාරකින් ද සහ බස්නාහිරට : පටුමඟකින් යුත් මෙහි විශාලත්වය උතුරේ සිට දකුණට, නැගෙනහිර සිට බඹ 15 සහ බස්නාහිර බඹ 12 1/2 සහ නැගෙනහිර සිට බස්නාහිරට බඹ 40 ක් වේ.

පහත සඳහන් කරන ලද පිඹුරු අංක 308 දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ඒ. එල්. මොහොමඩ් හුසේන් විසින් 2002 මැයි 15 වන දින මැනක දී කරන මැනීමකින් එය පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර වේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලයාඩිවෙම්බු ප්‍රාදේශීය සභා සීමාව තුල කරුන්කොඩිතිව් කොට්ඨාස අංක 8 හි පිහිටි ගොඩනැගිලි සමඟ වන ඉඩමට මායිම් වශයෙන් උතුරට : අලිසප්පු සහ තවත් අයට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : වෙන් කරන ලද සාගමම් පාරෙන් ද, දකුණට : පාරෙන්ද සහ බස්නාහිරට පොදු පාරක 7/8 වන මෙය විශාලත්වයෙන් හෙක්ටයාර් 0.1821 (අ. 0, රූ. 1, පර්. 32) ක් වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-1153/3

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කල්මුණේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

මොහොමඩ් හනීෆා බදූඋර්දීන් සහ වහිතා බානු බදූඋර්දීන්

2014 අගෝස්තු මස 28 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

නින්දවූර් ප්‍රසිද්ධ නොතාරිස් එස්. මුතුමීරන් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූද 2011 ජූලි 22 දින සහතික කළ අංක 7308 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් හනීෆා බදූඋර්දීන් සහ වහිතා බානු බදූඋර්දීන් ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හැටහතරලක්ෂ එක්දහස් පන්සිය අසූඑකයි ශත පනස්නමය (රු.6,401,581.59) ක මුදලක් 2014 ජනවාරි 30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 6,401,581.59 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ජනවාරි 31 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 7308 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තුවේ අඩ්ඩාලච්චෙන 04 පිහිටි කොන්නවත්ත තේඩම් සහ තාච්චවාඩිකඩු නැමති ඉඩම ලොට් 50 සහ 51 සමඟ ඒකාබද්ධ කොට බෙදා වෙන් කළ මැද කොටසේ විශාලත්වය උතුරේ සිට දකුණට අඩි 47, නැගෙනහිර සිට බස්නාහිරට අඩි 108 ක් වන මෙය උතුරට : කලන්තරලෙබ්බේ ටීවර්ට අයිති ඉඩමෙන්ද, නැගෙනහිරට : නීර් බස්කාන්ගේ ඉඩමෙන් ද, දකුණට : රකියාඋම්මා සහ රහුමාතුම්මාගේ ඉඩමෙන් ද සහ බස්නාහිරට : පාර ද මායිම් වලින් වට වී ඇත.

පහත සඳහන් කරන ලද පිඹුරු අංක 889 දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ඒ. එල්. මොහොමඩ් හුසේන් විසින් 2006 ඔක්තෝබර් 22 වන දින මැනක දී කරන මැනීමකින් එය පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර වේ.

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තුවේ අඩ්ඩාලච්චෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඩ්ඩාලච්චෙන ප්‍රාදේශීය සභා සීමාව තුල අඩ්ඩාලච්චෙන ගමේ පිහිටි ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : කලන්තර ටීවර්ගේ ඉඩමෙන් ද, නැගෙනහිරට: පටුමඟෙන් ද, දකුණට : රකියාඋම්මා සහ රහුමාතුම්මාගේ ඉඩමෙන් ද සහ බස්නාහිරට : පාරෙන්ද මායිම් වූ (අ.0, රූ. 0, පර්. 18.1) විශාලත්වයෙන් හෙක්ටයාර් 0.0458 ක් වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-1153/4

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතියයි

පුංචිහෙට්ටිආරච්චිගේ දිනේෂ් රුක්මල් අසංග පෙරේරා.

2014 ජුනි මස 26 පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූද 2011 සැප්තැම්බර් 07 දින සහතික කළ අංක 4808 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පුංචිහෙට්ටිආරච්චිගේ දිනේෂ් රුක්මාල් අසංග පෙරේරා යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූතුන්ලක්ෂ

තිස්නමදාහස් අටසිය හතලිස්හතයි ශත හැත්තෑ අට (රු. 93,39,847.78) ක මුදලක් 2014 අප්‍රේල් 30 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 93,39,847.78 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 මැයි 01 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලය වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලදවියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 4808 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ, වත්තල - මාබොළ ප්‍රාදේශීය සභා සීමාවේ කොට්ඨාස 2 හි වත්තල, පරණ මීගමුව පාරේ පිහිටි වරිපනම් අංක 129/1, දරන මදිටියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් 2010 සැප්තැම්බර් මස 28 වන දින මැන සාදන ලද අංක 10396 දරන පිඹුරේ ලොට් පී වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : මැක්ලරන්ස් ගබඩා සංකීර්ණය ද, නැගෙනහිරට: මෙම ඉඩමේම ඉතිරි කොටස සහ ලොට් කිව් ද, දකුණට : එම්. ඩී. ජේ. සී. ජයසුන්දරට අයිති ඉඩම ද සහ බස්නාහිරට : මැක්ලරන්ස් ගබඩා සංකීර්ණයට මායිම් වූ එකී අංක 10396 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23) වේ.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ වත්තල - මාබෝල ප්‍රාදේශීය සභා සීමාවේ කොට්ඨාස 2 හි වත්තල, මීගමුව පාරේ පිහිටි මදිටියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් 2002 පෙබරවාරි 18 දින මැන සාදන ලද අංක 7168 දරන පිඹුරේ ලොට් බී (අඩි 10 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : එම්. ඩී. ජේ. සී. ජයසුන්දරට අයිති ඉඩම ද සහ බස්නාහිරට: ලොට් ඒ වලින් ද මායිම් වූ එකී අංක 7168 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම හතයි හතරක් (අ. 0, රූ. 0, පර්. 3.74) ක් වේ.

බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් 2010 සැප්තැම්බර් මස 28 වන දින සාදන ලද අංක 10396 දරන පිඹුරේ ලොට් කිව් හි පාරක් සඳහා වෙන්කොට ඇති ප්‍රවේශ මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-1153/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.